# ජාතික අධ්‍යාපන ආයතනය
# බ්‍රේල් සහතික පත්‍ර පාඨමාලාව - 2023
# ඉල්ලුම්පත් කැඳවීම

ජාතික අධ්‍යාපන ආයතනයේ අන්තර්කරණ අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් මෙහෙයවනු ලබන උක්ත පාඨමාලාව සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

## ඉල්ලුම් කිරීම සඳහා සුදුසුකම්:

- අ .පො. ස. සාමාන්‍ය පෙළ සහ අ.පො.ස උසස් පෙළ විභාගය සමත්වීම හෝ ඊට ඉහළ වෘත්තීය සුදුසුකම් සපුරා තිබීම.
- රජයේ පාසල්, උපකෘත පාසල් හා රජයේ අනුමත පෞද්ගලික පාසල්වල විශේෂ අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉගැන්වීමේ කටයුතුවල නියුක්ත ගුරුවරයෙකු වීම.
- දෘෂ්ටි ඌණතා සහිත දරුවන් සිටින දෙමව්පියන් වීම හෝ එම දරුවන් සමග කටයුතු කිරීමට කැමැත්තක් දක්වන අයෙකු හෝ අධ්‍යාපන ක්ෂේත්‍රයේ වෘත්තිකයකු වීම.
- වයස අවුරුදු 18 - 50 අතර වීම. (අයදුම්පත් භාරගන්නා අවසන් දිනට)
- පාඨමාලා කාලයඃ මාස 06කි. (සති අන්ත දින 24යි)
- මාධ්‍යයඃ සිංහල

**ගාස්තුඃ**

| | |
|---|---|
| පාඨමාලා ගාස්තු | - රු. 20,000.00 |
| ඉල්ලුම්පත් ගාස්තු | - රු. 200.00 |
| ලියාපදිංචි ගාස්තු | - රු. 1.000.00 |

**පාඨමාලාවේ අන්තර්ගතය :**

- බ්‍රේල් ඉගැන්වීම පිළිබඳ කුසලතා
- බ්‍රේල් මඟින් (සිංහල දෙමළ, ඉංග්‍රීසි) භාෂා කුසලතා
- බ්‍රේල් ගණිතය කුසලතා
- බ්‍රේල් සඳහා වෙනත් සහ නව භාවිතයන්
  (බ්‍රේල් ආශ්‍රිත ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇතුළත්ය)

## ඉල්ලුම් කළ යුතු පිළිවෙළ

- ඉහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පාඨමාලාවට අයදුම් කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ වෙබ් අඩවියෙහි (www.nie.lk) දකුණු පස ඇති Educational Links යටතේ දැක්වෙන NIE Student Portal වෙත පිවිස Student Registration මගින් ශිෂ්‍ය ලියාපදිංචිය සිදු කිරීමෙන් අනතුරුව දිස්වෙන බැංකු රිසිට් පතෙහි දැක්වෙන ආකාරයට ගෙවීම් යොමු අංකයද සහිතව ලංකා බැංකු මුදල් තැන්පතු පත්‍රිකාව සම්පූර්ණ කර රු.200.00 ක මුදලක් දිවයිනේ ඕනෑම ලංකා බැංකු ශාඛාවකට ගෙවා ලබා ගත් කුවිතාන්සිය සමග **"අධ්‍යක්ෂ, අන්තර්කරණ අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම"** යන ලිපිනයට **2023 අප්‍රේල් 03** දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. (මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් භාරගනු නොලැබේ.) ඉල්ලුම් පත්‍රය බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "**බ්‍රේල් සහතික පත්‍ර පාඨමාලාව - 2023** " යනුවෙන් සඳහන් කළ යුතුයි.
- සම්මුඛ පරීක්ෂණයක් මඟින් සුදුස්සන් තෝරාගනු ලැබේ.
- දේශන මාර්ගගත තාක්ෂණය (zoom) ඔස්සේ සහ ජාතික අධ්‍යාපන ආයතනයේ දී ද පැවැත්වේ.

**ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න**
**අධ්‍යක්ෂ ජනරාල්,**
**ජාතික අධ්‍යාපන ආයතනය**
**මහරගම.**
**2023.03.02**